# බළන්ගොඩ නගර සභාව

## 2020-12-15 දිනැති අඩාලව කල් තබන ලදුව 2020-12-24 දින පවත්වනු ලැබූ සභා රැස්වීම් වාර්තාව

**ස්ථානය** - **බළන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාව**

**දිනය** - **2020.12.24**

**වේලාව** - **පෙ.ව. 10.00**

**බළන්ගොඩ නගර සභාවේ ගරු සභාපති චමික ජයමිණි විමලසේන මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් මෙදින සභාවේ කටයුතු පවත්වන ලදී.**

**සහභාගීත්වය**

| | |
|---|---|
| 1. ගරු සභාපති | චමික ජයමිණි විමලසේන මැතිතුමා |
| 2. ගරු උප සභාපති | එම්. ටී. එම්. රූමි මැතිතුමා |
| 3. ගරු නාගරික මන්ත්‍රී | ඩබ්. එම්. එන්. ජී. වීරසිංහ මැතිතුමා |
| 4. ගරු නාගරික මන්ත්‍රී | ඊ. ඒ. ජේ. ප්‍රේමකුමාර මැතිතුමා |
| 5. ගරු නාගරික මන්ත්‍රී | එම්. ජුනයිදීන් මලික්ෂා මැතිතුමා |
| 6. ගරු නාගරික මන්ත්‍රී | එම්. නිමල් කරුණාරත්න මැතිතුමා |
| 7. ගරු නාගරික මන්ත්‍රී | නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා |
| 8. ගරු නාගරික මන්ත්‍රිනි | ජී. චන්ද්‍රලතා මැතිතුමිය |
| 9. ගරු නාගරික මන්ත්‍රී | එම්.එස්.පී.ගලප්පත්ති මැතිතුමා |
| 10. ගරු නාගරික මන්ත්‍රී | එම්. ඩබ්. විමලසිරි මැතිතුමා |
| 11. ගරු නාගරික මන්ත්‍රී | එම්. එම්. රවීන්ද්‍ර සමන් කවිරත්න මැතිතුමා |
| 12. ගරු නාගරික මන්ත්‍රිනි | පී. කේ. එන්. ටී. ඩී. සමරසේකර මැතිතුමිය |
| 13. ගරු නාගරික මන්ත්‍රීනී | සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමිය |
| 14. ගරු නාගරික මන්ත්‍රිනි | එම්. ශාන්තිලේඛා මැතිතුමිය |
| 15. ගරු නාගරික මන්ත්‍රී | කේ. ජී. පේමදාස මැතිතුමා |

2020-12-15 දින අඩාලව කල් තබන ලද මහ සභාව නැවත වරක් කැඳවීම 2020-12-24 දින පෙ.ව. 10.00 ට ආරම්භ කරන ලදී.

මෙහිදී අදහස් දක්වන ලද ගරු සභාපතිතුමා තමන් අද උදෑසන මුහුණු පොතේ ඉන්දියාවේ විසූ ගෞරවනීය ජනාධිපතිවරයෙකු වන අබ්දුල් කළාම් විසින් කියූ වැකියක් දුටු බවද එතුමා විසින් " සත්‍යයට වස්ත්‍රයක් නොමැති වුවද ඇවිද යා හැකිය. බොරුව අනිවාර්යයයෙන් ඇඳුමකින් සැරසී සිටිය යුතුය" යන්න එහි ප්‍රකාශ කර තිබූ බව ද එය අප සභාවට ගැලපෙන බව ද පවසන ලදී.

එමෙන්ම තමන් රෝගාතුර වී රෝහල් ගත වූ අවස්ථාවේදී සභාවේ ජ්‍යෙෂ්ඨ මන්ත්‍රීවරුන් මූලාසනයේ තිබූ යම් යම් ලියකියවිලි තමන්ගේ සාක්කුවේ දමා ගත් බව ද උගත් බුද්ධිමත් යැයි සිතා ජනතාවගේ ඡන්දයෙන් පත් කරන ලද ජනතා නායකයින් එවැනි දේ නොකළ යුතු බවද ඒ පිළිබඳව තමන්ගේ කණගාටුව ප්‍රකාශ කරන බවද පවසන ලදී. එමෙන්ම නගරයේ නායකත්වය අපේක්ෂා කරන නායකයන් විසින් මෙවැනි දේ සිදු කිරීම යහපත් ආදර්ශයක් නොවන බවත් එවැනි අනර්ථකාරි ලැජ්ජා සහගත වැඩ මින් ඉදිරියට නොකරන ලෙසත් ප්‍රකාශ කරන ලදී.

එමෙන්ම සභාපතිතුමා නොමැති අවස්ථාවලදී නිලබලයෙන් ගරු උප සභාපතිතුමා, සභාපතිතුමාගේ කටයුතු ඉටු කිරීමට බැඳී සිටින අතර තමන්ගේ එම වගකීම පැහැර හැරීම පිළිබඳ කණගාටුව ප්‍රකාශ කරන බව ද මහජන මුදලින් නඩත්තු වන සභාවට ජනතාව විසින් පත් කර එවනු ලබන්නේ බුද්ධිමත්ව හා තාර්කිකව ගැටලු විසඳනු ඇතැයි විශ්වාසයෙන් යුතුව බව ද පවසන ලදී.

තවදුරටත් අදහස් දක්වමින් ගරු සභාපතිතුමා පැවසූයේ වර්තමාන පාර්ලිමේන්තු මන්ත්‍රී රත්නපුර දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු සභාපති අකිල එල්ලාවල මැතිතුමා කොතරම් ජ්‍යෙෂ්ඨ මන්ත්‍රීවරයෙකු වුවද ගරු නාගරික මන්ත්‍රී වශයෙන් සිටින සමයේ මෙම සභාවට පිවිසීමට පෙර මෙන්ම සභාවෙන් පිටවීමට පෙර හිස නමා සභාවට ආචාර කරන බවයි. එමෙන්ම තමන් ද මෙය ගෞරවාන්විත සභාවක් ලෙස පිළිගන්නා බව ද ගරු මන්ත්‍රීවරුන් දේශපාලන සහිකයින් වශයෙන් එම ගෞරවය කෙළසීමකින් තොරව තිබෙන්නා වූ යම් යම් ප්‍රශ්න විධිමත් පරිදි විසඳා ගැනීමට කටයුතු කරන ලෙසද පවසන ලදී.

එමෙන්ම මෙම සභාව පත් කර ඇත්තේ මන්ත්‍රීවරුන් පාලනය කිරීමට නොව ජනතාව පාලනය කිරීමට බවද එහිදී මන්ත්‍රීවරුන් අනවශ්‍ය ලෙස හැසිරෙන්නේ නම් එය සමාජයට කරන ලොකු අසාධාරණයක් බවද සභාව විසින් වැය කරන කාලය හා මුදල් ලබා දෙන්නේ මහජනතාවගේ සේවය ඉටු කිරීමට විනා මන්ත්‍රීවරුන්ගේ අවශ්‍යතාවයන් වෙනුවෙන් නොවන බවද පවසන ලදී.

ගරු සභාපතිතුමා විසින් අද දින න්‍යාය පත්‍රය 2020-12-15 වන දින අවසන් වූ තැනින් ආරම්භ කිරීමට නියමිත බව පවසන ලදී.

**09. ඇස්තමේන්තු අනුමත කිරීම.**

**09.01.01** මුගුණමලය බිංදු මහතාගේ නිවස අසළ මාර්ගයේ කාණුවේ අත්‍යවශය ඉතිරි කොටස ඉදි කිරීම - රු.90000.00

**09.01.02** කොටුගොඩැල්ල ගල්වල මාර්ගයේ අවශ්‍ය ස්ථාන පෙර නිමි මිශ්‍රණ යොදා සංවර්ධනය කිරීමට ABC කියුබ් 12 ක් ලබා ගැනීම. - රු. 118,724.16

**09.01.03** බෝම්බුව පන්සල් වත්ත පාරේ කොන්ක්‍රීට් කාණුව ඉදි කිරීම - රු.150,000.00

**09.01.04** මිරිස්කොටුව පාර අත්‍යවශ්‍ය ස්ථාන සඳහා පැති කාණු ඉදි කිරීම - රු.320,000.00

**09.01.05** කරව්කැටිය ගල්වල පාර පැති කාණුව ඉදි කිරීම දෙවන අදියර - 125,267.83

**09.01.06** කරව්කැටිය 5 වන පටුමග කාණුව ඉදි කිරීම - 825,219.22

**09.01.07** කරව්කැටිය ශාන්ත මහතාගේ නිවස ඉදිරිපිට කාණුව ඉදි කිරීම - 510,405.79

**09.01.08** දෙහිගස්තලාව කුමාරගම මාර්ගයේ විජයානන්ද මහතාගේ නිවස අසළ බෝක්කුව ඉදි කිරීම - රු.90,307.74

**09.01.09** බැංකියවත්ත වහලය සකස් කිරීම සඳහා වශය වැඩ කුලී ඇස්තමේන්තුව අනුමත කිරීම - රු.100,000.00

**09.01.10** සුදර්ශනපුර ප්‍රජා ශාලාවේ වැසිකිළි ඉදිකිරීම - රු.165,000.00

**09.01.11** වැවවත්ත උද්‍යානයේ නිවාස සංකීර්ණයේ වැසි ජල කානු පද්ධතිය සංවර්ධනය කිරීම - 854,000.00

**09.01.12** බළන්ගොඩ උඩ ඇල්ලෙපොල සරස්වතීවත්ත සුසාන භූමියේ සුසාන ගෙය ඉදි කිරීම - රු.899,000

ඉහත සඳහන් ඇස්තමේන්තු ගරු සභාපතිතුමා විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු උප සභාපති එම්.ටී.එම්.රූමි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙහිදී ගරු සභාපතිතුමා යෝජනාවක් ඉදිරිපත් කරමින් ගරු නාගරික මන්ත්‍රී එම්.ජී.ශාන්තිලේඛා මැතිතුමියගේ ඉතිරිව පවතින මන්ත්‍රී ප්‍රතිපාදන මගින් 09.01.12 යෝජනාවේ වැඩ අවසන් කළ නොහැකි බැවින් ඒ සඳහා මන්ත්‍රී ප්‍රතිපාදන ඉක්මවා වැය වන ඉතිරි මුදල වන රු.153,400.00 ක මුදල සභා අරමුදලින් ගෙවීම සුදුසු බවට කළ යෝජනාව ගරු නාගරික මන්තී එම්.ඩබ් විමලසිරි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී

**විරෝධතා නොමැති හෙයින් ඉහත සඳහන් ඇස්තමේන්තු ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**10. පෞද්ගලික මන්ත්‍රි පැහැදිලි කිරීම්**

**ගරු උප සභාපති එම්. ටී. එම්. රූමි මැතිතුමා**

පසුගිය සභාවේදි ගරු සභාපතිතුමා විසින් සභාව කරගෙන යාමට භාරදුන් අවස්ථාවේදී තමන් එය භාර නොගත්තේ එම සභාව 2020 වර්ෂයේ අවසාන සභාව නිසා බවත්, තමන්ට පෞද්ගලික මන්ත්‍රී පැහැදිලි කිරීම්වලදී බෙහෝ දේ කතා කිරීමට තිබුණු නිසා බවත් පවසන ලදී. තමන් ක්‍රීඩා ගුරුවරයෙක් වශයෙන් එදා හිල්බන් විද්‍යාලය සඳහා ගෝල් පෝස් දෙකක් ඉල්ලා තිබූ අවස්ථාවේදී පනත පරිදි නගර සභා බල ප්‍රදේශයෙන් පිටත ස්ථානයකට විශේෂයෙන්ම පෞද්ගලික විද්‍යාලයකට ලබාදීමට නොහැකි යැයි පැවසූ බව ද නගර සභාව තුළ රජයේ පාසලකට ලබා දෙන්නේ නම් පළාත් සභා අනුමැතිය ලබා ගත යුතු වෙන අතර තමන්ගේ ඥාතී හිතවත් දරුවන් එම පාසලට යන බැවින් එම අවස්ථාවේදී තමන් එයට විරුද්ධ වුණේ නම් තම රැකියාවට හොඳ නැති බව ද පවසන ලදී. එබැවින් තමන් ඔවුන් හට එය පහදා දුන් බවද 2006 තමන් මන්ත්‍රීවරයෙකු ලෙස පත්වූදා සිට බළන්ගොඩ මහජනතාව වෙනුවෙන් සහන ලබා දීමට කථා කල බවද ව්‍යාපාරිකයින් නගරයේ හදවත බවද එම කාරණා එදා සභාව අවසානයේ කථා කිරීමට සිටි බවද පවසන ලදී. එමෙන්ම පක්ෂ පාට ආගම් කුල භේද නොසලකා සහන ලබා දිය යුතු බවද සභාවේ ලබා ගත් තීන්දුවක් ආණ්ඩුකාරතුමාට වෙනස් කළ හැකි බවද සභාවට වඩා බලයක් එතුමාට පවතින බවද පැවසූ ගරු උප සභාපති එම්. ටී. එම්. රූමි මැතිතුමා උදාහරණයක් ලෙස නගර සභාවේ කඩ කාමරයක් වෙනත් අයෙකුට පැවරිය නොහැකි නමුත් ගරු ආණ්ඩුකාරතුමාගේ නියෝගයකට එසේ කළ හැකි බවත් සභාවට ගරු කිරීම මෙන්ම සභාවේ ආදර්ශවත් ලෙෂ හැසිරීම වැදගත් බවත් පවසන ලදී.

ටෙන්ඩකරු ටෙන්ඩර් ලබා ගන්නේ ප්‍රදේශයේ මෙන්ම රටේ එම අවස්ථාව වන විට පවත්නා වාතාවරණය අනුව බැවින් රටේ යම්කිසි අර්බුදකාරී අවස්ථාවක් වන විට එම ටෙන්ඩර්කරුවන්ට නීත්‍යානුකූලව හෝ සහනයක් ලබා දිය හැකිනම් දිය යුතු වන බව ද නගර සභාවේ ව්‍යාපාරිකයින්ගේ කුලිය සභාවේ ආදායම වන බැවින් එම සහනය ලබා දිය යුතු අතර සෑම ව්‍යාපාරිකයෙකුටම එක ලෙස සැලකිය යුතු බව ද පවසන ලදී.

එමෙන්ම දේශපාලනයේ හතුරන් හෝ මිතුරන් නැති අතර, සදාකාලික නොවන බව ද අවස්ථාවාදී නොවී නගර සභාවේ ජීවත්වන සියලු පුරවැසියන්ට එක සේ සහන ලබා දිය හැකි නම් දිය හැකි සහනය හැම කෙනෙකුටම ලබා දිය යුතු බව ද පැවසූ ගරු උප සභාපතිතුමා දේශපාලනික වශයෙන් සභාවේ මත ගැටුම්වලදී තමන් ගරු සභාපතිතුමා සමඟ විරද්ධ වූ නමුත් චමික වැවේගෙදර යනු තම කල්‍යාණ මිත්‍රයා බවද දේශපාලනික වශයෙන් එතුමාගේ මතය හා තමන්ගේ මතය වෙනස් බව ද තම පක්ෂයේ නියෝගය පරිදි තමන් කටයුතු කරන බවද පවසන ලදී.

තවදුරටත් අදහස් දක් වූ ගරු උපසභාපති එම්. ටී. එම්. රුමී මැතිතුමා පැවසූවේ 2021 වර්ෂයේ වෙනස් වීම කුමන ආකාරයෙන් සිදු වුවද බළන්ගොඩ ජනතාව වෙනුවෙන් සේවය කළ යුතු බවයි.

එමෙන්ම 2021 වර්ෂය සෞභාග්‍යමත් සුභ නව වසරක් වේවා යි පතමින් තම අදහස් දැක්වීම අවසන් කරන ලදී.

**ගරු නාගරික මන්ත්‍රිනී සුනේත්‍රා ඩී. වීරසිංහ මැතිතුමිය**

පසුගිය සභාවාරයේදී සිදු වූ ප්‍රශ්නය සම්බන්ධව තම කණගාටුව පළ කරන බව ද තමා නවක මන්ත්‍රීවරියක් වශයෙන් කරන්නේ කුමක්දැයි සිතා ගැනීමට නොහැකිව ඉතාම අසරණභාවයට පත් වූ බවද නවක මන්ත්‍රීවරුන් 5 ක් 6 ක් සිටින මෙම සභාව තුල එම අවස්ථාවේදී පරිණත මන්ත්‍රීවරුන්ගේ හැසිරීම නවක මන්ත්‍රීවරියක් ලෙස කණගාටුවෙන් හෙලා දකින බවද පැවසීය. එමෙන්ම බළන්ගොඩ නගර සභාව කීර්තිමත් නගර සභාවක් වන අතර සභාවට ඇතුළුවන විටම ගාම්භීරත්වයක් ඇති වන බවද මාධ්‍ය තුළින් ප්‍රචාරය වන්නේ වෙනමම දෙයක් බව ද සභාවේ නවක මන්ත්‍රීවරුන්ට ආදර්ශයක් වන ලෙස පරිණත මන්ත්‍රීවරුන් හැසිරිය යුතු බවද පැවසූ ගරු නාගරික මන්ත්‍රිනී සුනේත්‍රා ඩී. වීරසිංහ මැතිතුමිය සභාවේ කාන්තා මන්ත්‍රීවරියන් සිටින බැවින් මන්ත්‍රීවරුන් කථා කිරීමේදී හා හැසිරීමේදී වගකීමෙන් හැසිරිය යුතු බවද සභාව තුළ පමණක් මන්ත්‍රීවරුන් වන නමුත් සභාවෙන් පිටතට ගිය විට එකම

සහෝදර කැලක් බව ද සභාවේ ගැටලුවක් තිබේනම් සාකච්ඡා කර විසඳා ගත යුතු බවද පවසන ලදී.

**ගරු නාගරික මන්ත්‍රී කේ. ජී. පේමදාස මැතිතුමා**

උප සභාපතිතුමාගේ කථාවේදී ඔහු ගැන අදහසක් ඉදිරිපත් කළ අතර මස් කඩ ටෙන්ඩරය පිළිබඳ ලිපිය ගෙනා අවස්ථාවේදී තමන් කථා කළේ පනත හා නීති පරිදි ක්‍රියාත්මක විය යුතුය යන්න පිළිබඳව බවත්, පනත් නීති සකස් කර ඇත්තේ මකුළු දැලක් ලෙස බවත් ය. ලොකු මිනිසුන්ට නීතිය නොමැති අතර කුඩා මිනිසුන්ට පමණක් නීතිය ක්‍රියාත්මක වන බවද මේ වන විට අධිකරණය ගැන මිනිසුන්ගේ විශ්වාසය පළුදු වී ඇති බවද සභාවේ කටයුතු කිරීම වෙනුවෙන් පනතක් මෙන්ම මාර්ගෝපදේශයක් පවතින අතර එමගින් මග පෙන්වීමක් සිදු කරන බවද සාධාරණ හේතුමත ඒවායේ වෙනස් කම් කිරීමට හැකියාවක් තිබෙන නමුත් 2021 වසරේදී මස් කඩ ලබා ගත් ටෙන්ඩර්කරු එම ව්‍යාපාරය ආරම්භ කිරීමට පෙර සහන ඉල්ලීම පිළිබඳ තමන් විරුද්ධත්වය ප්‍රකාශ කරන බවද පවසන ලදි. සමහර මන්ත්‍රීවරුන් වෙළෙන්දන්ගෙන් පෞද්ගලික ලාභ ප්‍රයෝජන ලබන නමුත් තමන් කිසි දිනක එවැනි ලාභ ප්‍රයෝජන ලබා නොමැති බවත්, නගර සභා සීමාව තුළ සභාවේ අවධානය ලැබිය යුතු දුගී දුප්පත් ජනතාව සිටින අතර ඔවුන්ට අවශ්‍ය සහන ලබා දිය යුතු බවද සභාව වෙත ආදායම් උත්පාදන යෝජනා ඉදිරිපත් කිරීමට හැකියාවක් ඇති නමුත් ආදායම් අඩු කිරීමට යෝජනා ඉදිරිපත් කළ නොහැකි බවද කිසිදු මන්ත්‍රීවරයෙකුට කිසිඳු මන්ත්‍රීවරයෙක් පිළිබඳ පෞද්ගලික අමනාපයක් නොමැති බවද පවසන ලදී. තවදුරටත් අදහස් දක්වමින් ගරු නාගරික මන්ත්‍රි කේ.ජී. පේමදාස මැතිතුමා පැවසූවේ සභාවේදී උසුළු විසුළු සමග ව්‍යාංගාර්ථයෙන් කරුණු පවසන අතර සභාවේ එවැනි දේ සිදු නොවිය යුතු බවයි.

අනතුරුව ගරු නාගරික මන්ත්‍රි කේ.ජී. පේමදාස මැතිතුමා 2021 වසරේදී සාර්ථකව කටයුතු කිරීමට හැකිවේවායි පතමින් තම කරුණු දැක්වීම අවසන් කරන ලදී.

**ගරු නාගරික මන්ත්‍රීනී ජී.චන්ද්‍රලතා මැතිතුමිය**

ගරු නාගරික මන්ත්‍රිනී ජී. චන්ද්‍රලතා මැතිතුමිය අදහස් දක්වමින් තමන් සභාවට නවක සභිකයෙකු ලෙස පත්ව පැමිණීමේ දී සභාවේ සිදුවන්නේ කුමක්දැයි එතරම් දැනීමක් නොතිබුණු නමුත් ගරු උප සභාපතිතුමාගේ කථාවෙන් දේශපාලනය යනු කුමක්ද? පක්ෂය විපක්ෂය යනු කුමක්ද? ගනු ලබන තීන්දු තීරණවල එම අවස්ථාවේදී දකින වෙනස්කම් මොනවාද? යන්නත් දේශපාලනයේදී මිනිසා වෙනස් වන්නේ දේශපාලන මතිමතාන්තර අනුව බව තේරුම් ගත් බව පැවසීය. එමෙන්ම ගරු උප සභාපතිතුමාගේ කථාවේදී තේරුණු තවත් එක් දෙයක් වන්නේ එතුමා හැමවිටම නගරයේ හදවත වෙළෙඳ ව්‍යාපාරිකයින් වන බව සඳහන් කරමින් ඔවුන්ට සහනය ලබා දෙන නමුත් එහි යහපත් හා අයහපත් පැති දෙකක් තිබෙන බවද නවක මන්ත්‍රීවරුන් ලෙස මස් කඩය පිළිබඳ තමන් කිසිඳු දෙයක් කථා නොකළ බවද නගර සභාවට අයවීමට ඇති මුදල් සභාවට අය කර ගැනීම තුළින් සභාවට ආදායම ලබාගෙන ජනතාවට සේවය කළ යුතු බවද සභාවේ සංවර්ධන කටයුතු සිදු කිරීම සඳහා සභාවේ මුදල් ඉතිරි කරගත යුතු බවද හරක් මස් කඩ කාමරය බැලීමට ගිය අවස්ථාවේදී බළන්ගොඩ ජනතාවට තනිකරම කවන්නේ අසූචි බව දුටු බව ද එම ස්ථානයේ පිරිසිදුභාවය පිළිබඳ සැලකිලිමත් වී බළන්ගොඩ ජනතාවගේ සෞඛ්‍ය සම්පන්න බව ගැන විමසිලිමත් විය යුතු බව ද පවසන ලදී.

එමෙන්ම මාධ්‍යවලින් ඇතැම් සභාවල සිදු වූ ගැටුම් දුටු බව ද එම ගැටුම්වලට සාපේක්ෂව අපේ සභාවේදී සිදු වූ ගැටුම් එතරම් ලොකු ගැටුම් නොවන බව ද දේශපාලනය මෙය වන බව ද පැවසූ ගරු නාගරික මන්ත්‍රීනී ජී. චන්ද්‍රලතා මැතිතුමිය සියලුම කටයුතු නීත්‍යානුකූල ලෙස සිදු කළ යුතු බවත්, එළඹෙන නව වසර මෙවැනි ප්‍රශ්න හා ගැටලු වලින් තොරව යහපත් ආකාරයෙන් පවත්වාගෙන යාමට හැකියාව ලැබෙනු ඇතැයි තමා විශ්වාස කරන බවත් පැවසීය. එමෙන්ම තමන් සම්බන්ධීකරණ කමිටුවේදී සුනිල් ගරාජය අසළ විශාල බැම්මක් සකස් කිරීමට ඉල්ලූ අතර එමගින් සභාවට විශාල සහනයක් ලැබෙන බවද මාර්ග සංවර්ධන අධිකාරිය විසින් ආනන්ද මෛත්‍රී මාවත මේ වන විට ශුද්ධ කරමින් පවතින අතර ඒ පිළිබඳ අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම සම්බන්ධයෙන් ගරු සභාපතිතුමාට ස්තුතිය පළ කරන බව ද ලබන්නා වූ නව

වසර සුභ නව වසරක් වේවායි ප්‍රාර්ථනා කරන බව ද පවසමින් තම අදහස් දැක්වීම අවසන් කරන ලදී.

මෙහිදී අදහස් දක්වන ලද ගරු උප සභාපතිතුමා පවසා සිටියේ පොදු වෙළෙඳසැල ගැන මන්ත්‍රීවරුන් සැම සභාවකම කථා කළ නමුත් ක්‍රියාත්මක කිරීම කළ නොහැකි බවයි.

**ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා**

ගරු සභාපතිතුමා අසනීප වූ අවස්ථාවේ දී එතුමාගේ සුවදුක් විමසීමට තමන්ට පැමිණීමට නොහැකි වීම පිළිබඳව සමාව ඉල්ලූ ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා එසේ නොපැමිණියේ තමාගේ පුද්ගලික අමනාපයක් නිසා නොවන බවත් රාජකාරි නිසා යාමට නොහැකි වූ බැවින් ඒ පිළිබඳ අමනාපයක් ඇති කර නොගන්නා ලෙස පවසන ලදී.

ගරු උප සභාපතිතුමාගේ කථාවේදී සභාවේ නීති රීති සම්බන්ධව විවිධ අවස්ථාවල දී විවිධ මත වල සිටින බව පැවසූ බව ද පසුගිය කොරෝනා වසංගත කාලය තුළ සහන ලබා දීමට කටයුතු කළ නමුත් මස් කඩයේ ගිවිසුම් ඇප තැම්පත් එක් මාසයකට පමණක් තැම්පත් කර ඉතිරි මාස දෙකේ තැම්පත් නොකර සිටීම පිළිබඳ කාරණයේදී එය කොතරම් දුරට නීත්‍යානුකූලද යන ගැටලුව පැණ නැගුණු බව ද මෙවැනි කාරණා නිසා අධිභාරවලට ලක්විය හැකි බව පසුගිය සභාවක දී ජ්‍යෙෂ්ඨ මන්ත්‍රීවරුන් පැවසූ බව ද යම් කිසි ක්‍රමවේදයක් තිබේනම් ටෙන්ඩර් කොන්දේසි වලට පටහැනිව ලබා දීමට තමන්ගේ කිසිම විරෝධතාවයක් නොතිබුණු බව ද පවසන ලදී. එමෙන්ම තමන්ගේ මූලිකත්වයෙන් මේ දිනවල ඉදිවන නිවසට නගර සභාවේ ගරු සභාපතිතුමා ලේකම්තුමිය ඇතුලු කාර්ය මණ්ඩලය විශේෂ සහයෝගයක් ලබාදුන් අතර ඒ සම්බන්ධව ස්තුතිය පළ කරන බව ද බුලත්ගම කොට්ඨාශයේ මාර්ග පද්ධතිය සංවර්ධන නොකිරීම පිළිබඳ දිගින් දිගටම කළ ඉල්ලීම අනුව මේ වන විට එය සකස් කිරිමට කටයුතු කිරීම සම්බන්ධව විශේෂ ස්තුතියක් කර්මාන්ත කමිටුවේ ගරු සභාපතිතුමාට පළ කරන බව ද පැවසීය. මීට අමතරව සභාවේ කර්මාන්ත අංශයේ සේවය කරන කම්කරුවන් සඳහා අවශ්‍ය ආරක්ෂිත උපකරණ හා මෙවලම් නොමැති බැවින් මේ පිළිබඳව අවධානය යොමු කරන ලෙස ද කම්කරුවන්ගේ දෛනික වැටුප

කම්කරුවන්ගේ පළපුරුද්ද අනුව හෝ ශ්‍රේණිගත කර දෛනික වැටුප වැඩි කර දීමට හැකි ක්‍රමවේදයක් තිබේනම් අවශ්‍ය කටයුතු සිදු කරන ලෙසද වැඩිදුරටත් පවසන ලදී.

මෙහිදී අදහස් දක්වන ලද ගරු සභාපතිතුමා පවසා සිටියේ එහි පූර්ණ වගකීම වැඩ අධිකාරිතුමා සතුව පවතින බැවින් ඒ පිළිබඳව වගකීමෙන් කටයුතු කරන ලෙසයි.

ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා අදහස් දක්වමින් වෙන්දේසි කරන ලද ඉඩම්වල විදුලිය ලබා දීමට ගිය අවස්ථාවේදී බිම්කට්ටි අනුමත නොවීම පිළිබඳ ගැටලුවක් මතුවූ බැවින් වෙන්දේසි කරන ලද ඉඩම් විකිණීම සම්බන්ධව මීට වඩා සභාවේ අවධානය යොමු කරන ලෙස පැවසූ අතර, ලබන්නා වූ නව වසර සුභ නව වසරක් වේවායි ප්‍රාර්ථනා කරමින් තම අදහස් දැක්වීම අවසන් කරන ලදී.

**ගරු නාගරික මන්ත්‍රී එම්.ජුනයිදීන් මලීක්ෂා මැතිතුමා**

ගරු නාගරික මන්ත්‍රී එම්. ජුනයිදීන් මලීක්ෂා මැතිතුමා අදහස් දක්වමින් මස් කඩ පිළිබඳව චන්ද්‍රලතා මන්ත්‍රීතුමිය පැවසූ කාරණාව සත්‍යයක් වන අතර එය පිළිගත යුතු බව ද හරක් මස් කඩය වාර්ෂිකව ලක්ෂ 85 කට අධික මුදලකට ටෙන්ඩර් වූ නිසා සභාවේ මන්ත්‍රීවරුන් සභාවේ ආදායම පිළිබඳ සතුටු වූ නමුත් එයින් පහර වදින්නේ පාරිභෝගිකයින් සඳහා වන බවද පවසන ලදී. එමෙන්ම සුබයිර් අලීම් මාවතේ කාණු පද්ධතිය සම්බන්ධව ගැටලුව කඩිනමින් විසඳා දෙන ලෙසද ෆලීල් හාජියාර් මාවතේ සුසාන භූමිය අසළ කාණු පද්ධතියේ ගැටලුවක් පවතින බැවින් එහි කාණුව සකස් කර දෙන ලෙසද තමන්ගේ මන්ත්‍රී ප්‍රතිපාදනවලින් දෙහිගස්තලාව පල්ලියේ පැති බැම්ම සකස් කළ අතර එය සභාවේ අනුමත වු නමුත් එහි මුදල් ගෙවීමේදී ගැටලුවක් පවතින බව ද මේ නිසා එහි කොන්ත්‍රාත්කරු අපහසුතාවයකට ලක්ව ඇති බව ද පවසන ලදී.

එමෙන්ම රට තුළ පවතින කොවිඩ් 19 වසංගත තත්ත්වය තුළ මුස්ලිම් ජනතාවට පවතින ලොකුම ගැටලුව වන්නේ භූමදානයද ආදාහනයද යන්න බව ද මුස්ලිම් ජනතාව අද වන විට වේදනාවෙන් සිටින්නේ කොරෝනා සැදීමට බයෙන් නොව ආදාහනය කිරීම සම්බන්ධයෙන් වන බවද තම ආගමට අනුව මෙම ජීවිතය තාවකාලික ජීවිතයක් වන අතර මුස්ලිම් ආගමිකයින්ගේ ස්ථිර ජීවිතය ආරම්භ වන්නේ

මෙම ජීවිතය අවසන් වූවායින් පසුව බවද මුස්ලිම් ආගමිකයින්ට පමණක් නොව වෙනත් ආගමිකයින්ට වුවද තම දරුවන්ට හෝ අවසන් ගෞරව දැක්වීමටත් ආගමික වතාවත් සිදු කිරීමටත් අවස්ථාව ලැබිය යුතු බව ද පැවසූ ගරු නාගරික මන්ත්‍රී එම්. ජුනයිදීන් මලික්ෂා මැතිතුමා මුස්ලිම් ජනතාවගේ දේහයන් භූමිදානය කරන්නේද නැතහොත් ආදාහනය කරන්නේද යන්න පිළිබඳ සභාවේ මතය කුමක්දැයි විමසන ලදී.

අනතුරුව සුභ නත්තලක් මෙන්ම 2021 වසර සුභ නව වසරක් වේවායි පතමින් තම අදහස් දැක්වීම අවසන් කරන ලදී.

**ගරු නාගරික මන්ත්‍රී කේ.ජී.පේමදාස මැතිතුමා**

ගරු නාගරික මන්ත්‍රී කේ. ජී. පේමදාස මැතිතුමා අදහස් දක්වමින් ඉතාම අනුවේදනීය කථාවක් සිදු කළ අතර ලෝකයේ රටවල් 190 කට අධික සංඛ්‍යාවක් භූමිදානය සිදු කරන බවද මුස්ලිම් ජනතාව හා සිංහල ජනතාව අතර වෛරී සහගත ආකල්පයක් පසුගිය මැතිවරණ කාලය තුළ ඇති කළ බව ද දැනට ලෝකයේ සිටින වෛද්‍ය විශේෂඥවරු පවසන පරිදි භූමිදානය කිරීමේ හෝ ආදාහනය කිරීමේ කිසිදු ගැටලුවක් නොමැති බව ද ලංකාවේ සිටින ක්ෂුද්‍ර ජීවි පිළිබඳ විශේෂඥ වෛද්‍යවරු මෙය භූමිදානය කළාට ගැටලුවක් නොමැති බව පවසා ඇති බව ද සඳහන් කරන ලදී. එමෙන්ම කොරෝනා රෝගීන්ගේ මළ මුත්‍රා ආදී අසූචි පොළොවට එකතු වන අතර එසේනම් එමගින් බලපෑමක් ඇති විය යුතු බව ද මෙය තනිකරම සිංහල බෞද්ධයින් පිනවීම සඳහා කරන උපක්‍රමයක් බවද පවසන ලදී. මේ සම්බන්ධව තවදුරටත් අදහස් දක්වමින් ගරු නාගරික මන්ත්‍රී කේ. ජී. පේමදාස මැතිතුමා මුස්ලිම් ජනතාවගේ සාධාරණ ඉල්ලීමක් මෙහි තිබෙන බව ද විවිධ ජාතීන් අතර විවිධ සංස්කෘතීන් තිබෙන බව ද භූමිදානය කළ පසු නැවත උට්ඨානය වන බවට හා ඉන් අනතුරුව ස්වර්ගයට යන බවට විශ්වාසයක් මුස්ලිම් ජනතාව තුල තිබෙන බවද ඒ අනුව විවිධ සංස්කෘතීන් වලට ගරු කළ යුතු බව ද පවසන ලදී. එසේ නොමැතිවුවහොත් සමාජයේ පවතින විවිධත්වය කුමක්දැයි විමසූ අතර විවිධ සංස්කෘතින් පැවතීම නිසා සමාජයේ ලස්සන වන බව ද මේ නිසා පත්කර ඇති විශේෂඥ කමිටුවේ තීරණය කඩිනමින් ලැබෙන බවද මෙම රෝග ව්‍යාප්තියට හේතුව භූමිදානයට බිය වීම මත මුස්ලිම් ජනතාව හැංගීම නිසා බවද පවසන ලදී. එබැවින් මේ සම්බන්ධව මැදිහත් විය යුතු අය මැදිහත්

වී අවශ්‍ය සුදුසු තීරණය ගත යුතු බවද තමන් බෞද්ධයෙකු ලෙස මුස්ලිම් ජනතාව පත්ව ඇති තත්ත්වය පිළිබඳ කණගාටුව ප්‍රකාශ කරන බව ද සඳහන් කරන ලදී.

**ගරු නාගරික මන්ත්‍රී ඊ. ඒ. ජේ. ප්‍රේමකුමාර මැතිතුමා**

ගරු නාගරික මන්ත්‍රිනී සුනේත්‍රා ඩී. වීරසිංහ මැතිතුමිය සභාවේ කථා කරමින් මන්ත්‍රීවරුන්ගේ හැසිරීම අශෝබන බවට චෝදනා කළ අතර 1991 වර්ෂයේ සිට සභාවේ ආණ්ඩු පක්ෂයේ මෙන්ම විපක්ෂයේ ද තමන් සිටි අතර එම කාලය තුළ කිසි දිනක මෙවැනි තත්ත්වයක් උදා වී නොමැති බවද මෙය මන්ත්‍රීවරුන්ගේ වැරැද්දක් නොව විකෘති ඡන්ද ක්‍රමය  නිසා ඇති වූ දෙයක් බව ද පැවසූ ගරු නාගරික මන්ත්‍රී ඊ. ඒ. ජේ. ප්‍රේමකුමාර මැතිතුමා සභාවේ බලය ලබා ගැනීම හා බලය හුවමාරුව සිදුවූයේ මෙම විකෘති ඡන්ද ක්‍රමය තුළින් බවද තමන් කිසි දිනෙක සභාවේ අශෝබන ලෙස හැසිරී නොමැති බවද ගරු සභාවේ සභිකවරුන් පත් කර එවා ඇත්තේ බදු ගෙවන ජනතාව විසින් බවද පැවසීය. එබැවින් සභාවේදී කථා කළ යුත්තේ බළන්ගොඩ නගරයේ බදු ගෙවන ජනතාවගේ සුභ සිද්ධිය උදෙසා බවද ඇතැම් මන්ත්‍රීවරුන් පළාත් සභාවේ හා පාර්ලිමේන්තුවේ කථා කළ යුතු කාරණා මෙහි කතා කරන බැවින් ගැටුමක් හට ගන්නා බවද පවසන ලදී. එමෙන්ම 2020 වසරේදී අතිගරු ජනාධිපතිතුමාගේ, අගමැතිතුමාගේ හා රත්නපුර දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී අකිල එල්ලාවල මැතිතුමාගේ ප්‍රතිපාදන මත බළන්ගොඩ ජනතාවට සේවය කිරීමට හැකි වූ බවද ඒ පිළිබඳව සියලු දෙනාට ස්තුතිය පුද කරන බව ද පැවසූ ගරු නාගරික මන්ත්‍රී ඊ. ඒ. ජේ. ප්‍රේමකුමාර මැතිතුමා 2021 වසරේදී ද තම ආණ්ඩුවේ ප්‍රතිපාදන හා  සභාවේ ප්‍රතිපාදන ලබා ගෙන ක්‍රීඩා පිටිය ඇතුළු බළන්ගොඩ නගරය සංවර්ධනය කරමුයි ඉල්ලා සිටිමින් ලබන්නා වූ නව වසර ලෝක වාසී සියලු දෙනාට සුභ නව නසරක් වේවායි ප්‍රාර්ථනා කරන ලදී.

**ගරු නාගරික මන්ත්‍රී ඩබ්. එම්. එන්. ජී. වීරසිංහ මැතිතුමා**

පසුගිය සභාවේදී සිදු වූ කලබගැනියට හේතුව මෙවර මැතිවරණයේ විකෘති ඡන්ද ක්‍රමය බවද මෙම සභාවේ අයවැය දෙවරක් පරාජය වුවද සභාවේ වැඩ කටයුතු කිරීමට අවස්ථාව ලබා දුන් නමුත් පනත පරිදි තුන්වන අයවැය පරාජය වූ පසුව සභාපති ධුරය අහෝසි වන බව ද ඒ බව පැවසූ අවස්ථාවේ ගරු සභාපතිතුමා එය නොපිළිගත් නිසා

එදා එම තත්ත්වය ඇති වූ බව ද පවසන ලදී. එමෙන්ම සභාවේ ස්ථිර කරගත් කම්කරුවන් වෙනත් කාර්යයන්වල යෙදවීම මත දෛනික පදනම මඟින් සුදුසුකම් නොමැති සේවකයන් බඳවා ගැනීම නිසා ඔවුන්ට වැටුප් ගෙවීමට සභාවේ මුදල් වැය වන බවද අනුප්‍රාප්තිකයන් නොමැතිව සේවකයින් නිදහස් කළ බව ද එමඟින් සභාවට අලාභයක් සිදු වන බව ද නිත්‍ය තනතුරු සඳහා කිසිවෙකු යොදා නොමැති බවද පැවසූ ගරු නාගරික මන්ත්‍රී ඩබ්. එම්. එන්. ජී. වීරසිංහ මැතිතුමා මහජන පොළේ කටයුතු සඳහා පොදු වෙළෙඳසැල් භාරකරු යොදවන ලෙසත් ඔහු හොරකම් කරන්නේ නම් ඔහුට නීත්‍යානුකූල ක්‍රියාමාර්ග ගන්නා ලෙසත් අද වන විට මහජන පොලේ බිල්පත් නිකුත් කරනුයේ කම්කරුවන් විසින් බවත් පවසන ලදී.

ගරු නාගරික මන්ත්‍රී ඩබ්. එම්. එන්. ජී. වීරසිංහ මැතිතුමා වැඩිදුරටත් අදහස් දක්වමින් භූගත ජලයට කොරෝනා වෛරසය එක්වන බවද ලංකාවේ භූගත ජලය ඉහළින් පිහිටා ඇති බැවින් මෙම තීන්දුව ගෙන ඇති බවද පැවසූ අතර එළඹෙන නව වසර සුභ නව වසරක් වේවා යි ප්‍රාර්ථනා කරන බව ද පැවසීය.

**ගරු නාගරික මන්ත්‍රී එම්. ඩබ්. විමලසිරි මැතිතුමා**

මෙම වසරේ අවසාන සභාව පැවැත්වෙන අද දින සභාවේ මන්ත්‍රීවරුන් එකම කාරණය ව්‍යංගයෙන් විවිධ ලෙස පවසන බවද ගරු නාගරික මන්ත්‍රී ඊ. එම්. ජේ. ප්‍රේමකුමාර මැතිතුමා එතුමාගේ කථාවේදී සද්භාවයෙන් කථා කළ බව ද එහි දී පළාත් පාලන ආයතනය පුංචි ආයතනයක් බැවින් ලොකු ආයතන සමඟ හැප්පෙන්න එපා යැයි පැවසූ බව ද පුංචි ආයතනවල අය ජනාධිපති, අගමැති ඇතුළු කැබිනට් මණ්ඩලය පත් කිරීමට මූලික වන බැවින් මුස්ලිම් ජනතාවගේ ගැටලුව පිළිබඳ ගරු නාගරික මන්ත්‍රී එම්. ජුනයිදීන් මලික්ෂා මැතිතුමා හඬ නැගිය යුතු වන බව ද මුස්ලිම් ජනතාවට ලොකු අසාධාරණයක් වන බව ද පවසන ලදී. එමෙන්ම තම තමන්ගේ ආගමික අදහස් විවිධ වන බැවින් සිතුම්පැතුම් ආගමික වතාවත් තම ආගම අනුව කළ යුතුව තිබෙන අතර මෙම රට තුළ අනෙකුත් ජනතාවට ජීවත් වීමට හැකි වන පරිදි නීති රීති සකස් කිරීම කළ යුතු බව ද එය ඉහළ තනතුරුවල සිටින්නන්ගේ වගකීමක් බව ද පැවසීය.

වැඩිදුරටත් අදහස් දක්වමින් ගරු නාගරික මන්ත්‍රී එම්. ඩබ්. විමලසිරි මැතිතුමා මෙම සභාවේ මෙම මස තුළදී විශේෂ සිදු වීම් කිහිපයක් සිදු වූ බවද තමන් ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරයෙකු වශයෙන් සිටි අතර මෙවැනි සිදුවීමක් සිදු වූ පළමු අවස්ථාව මෙය වන බවද පවසන ලදී. එමෙන්ම පසුගිය වසරේ විශාල සංවර්ධනයක් කිරීමට ගරු සභාපතිතුමා විසින් ප්‍රතිපාදන ලබා දුන් අතර මධ්‍යම රජය හා පළාත් සභාව මඟින් මුදල් ප්‍රතිපාදන ලැබුණු බවද එමඟින් සංවර්ධනයන් සිදු කිරීමට හැකි වූ බවද පැවසූ ගරු නාගරික මන්ත්‍රී එම්. ඩබ්. විමලසිරි මැතිතුමා 2021 වර්ෂයට කාලෝචිත අයවැයක් ඉදිරිපත් කර ඇති අතර එමඟින් ලබන්නා වූ වසරේ බළන්ගොඩ ජනතාවගේ අවශ්‍යතාවන් ඉටු කිරීමට හැකියාව ලැබේවායි මෙන්ම 2021 වර්ෂය කොවිඩ් 19 රෝගය ලෝකයෙන් තුරන් වී ගොස් සුභ නව වසරක් සැමටම උදා වේවායි පතමින් තම අදහස් දැක්වීම අවසන් කරන ලදී.

**ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා**

සභාවේ වැඩ කටයුතු කිරීමේදී පක්ෂ දෙකක සිටියද ගරු සභාපතිතුමා අසනීප වූ අවස්ථාවේදී තමන් බොහෝ කණගාටුවට පත් වූ බවද කුමන ප්‍රශ්න තිබුණද එක මවකගේ දරුවන් සේ සිටින බවද පවසන ලදී. ඇතැම් ස්ථානවල අනවසර බැම් ඉදිකරන බැවින් ඒ පිළිබඳ අවධානය යොමු කරන ලෙසද සභාවෙන් ඉදිකරන ලද බැම්මට උඩින් වෙනත් බැම් ඇතැම් ස්ථානවල ඉදිකර ඇති බව ද පුරණ ගෙදර පාරෙහි එවැනි බැම් පවතින බවද අයාලේ යන ගවයින් දෙදෙනෙක් මැරුණු අතර මේ නිසා අයාලේ යන ගවයින් පිළිබඳ තීන්දුවක් ගන්නා ලෙස ද පවසන ලදී.

අනතුරුව ලබන්නා වූ නව වසර ලෝක වාසී සියලු දෙනාට සුභ නව වසරක් වේවායි ප්‍රාර්ථනා කරමින් තම අදහස් දැක්වීම අවසන් කරන ලදී.

**ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා**

තමන් ජාතික දේශපාලනය ගැන කථා නොකරන බවත් පාරේ යන අවස්ථාවල දී දකින ප්‍රශ්ණ ගැන කථා කරන බවත් පැවසූ ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා දෙසැම්බර් 28 වෙනි දින සමන් දේවාල පෙරහැර පවතින බවද ක්‍රීඩාංගනය හා වැසිකිළි අතර පවතින පාර්ක් එක සංවර්ධනය කරන ලෙසද ලංකා බැංකු මාවත

නම් කිරීමේ කටයුතු කඩිනමින් ඉටු කරන ලෙසද පදික කඩ අසළ සිට මොහාන් සාලිය එල්ලාවල මාවත දක්වා මාර්ගය යා කිරීම සිදු කරන ලෙසද බළන්ගොඩ නගරයේ ත්‍රීවිල් පාර්ක් සැලසුම් සහගත ලෙස සකස් කිරීම සුදුසු බවද ත්‍රීවිල් රථ රියදුරන්ගේ විනය ක්‍රමවත් කිරීම සඳහා අවශ්‍ය වැඩ පිළිවෙලක් ක්‍රියාත්මක කරන ලෙසද පවසන ලදී. එමෙන්ම ටෙලිකොම් වලවල්වල පියන අලුතින් දැමීම සඳහා එම ආයතනය දැනුවත් කර ලෙසද මාර්ග සංවර්ධන අධිකාරිය විසින් මාර්ගවල දමන කොන්ක්‍රීට් පියන් අතර පවතින හිඩස විශාල බැවින් ඒ තුළට කාන්තාවන්ගේ සෙරෙප්පු වල අඩිය යෑම නිසා මහත් අපහසුතාවයකට ලක්වන බව ද එම නිසා ඒ පිළිබඳ එම ආයතනය දැනුවත් කරන ලෙස ද පැවසූ ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා පුස්තකාලයේ ශාඛා පුස්තකාලවල වැඩ ආරම්භ කරන ලෙසද පාපන්දු ගෝල් පෝස්ට් එක සඳහා අලුතෙන් දැල් දෙකක් ආරම්භ කර දෙන ලෙසද පිට්ටනියේ විදුලි බල්බ කඩිනමින් දමන ලෙසද ළමා උද්‍යානය මේ වන විට රෙස්ටුරන්ට් එකක් බවට පත්ව ඇති බවද සියලු මන්ත්‍රීවරුන් පනත අධ්‍යනය කර පැමිණෙන්නේ නම් ජ්‍යෙෂ්ඨ නවක පරතරයක් නොමැති වන බවද පැවසීය.

අනතුරුව ලබන්නා වූ නව වසර සියලු දෙනාට සුභ නව වසරක් වේවායි ප්‍රාර්ථනා කරමින් තම අදහස් දැක්වීම අවසන් කරන ලදී.

**11. අවසානය**

ගරු සභාපතිතුමා අදහස් දක්වමින් මෙතරම් කාලයක් අප සභාව ඉතාමත් සහෝදරත්වයෙන් එකමුතුකමින් එකිනෙකාට ගරු කරමින් සභාවේ කටයුතු පවත්වා ගෙන ගිය අතර අද දින සභාවේ මන්ත්‍රීවරියක් ඉලක්ක කර පැවසූ දෙය පිළිබඳ කණගාටුව ප්‍රකාශ කරන බව ද සෑම මන්ත්‍රීවරයෙකුම දරන්නේ ගෞරවාන්විත තනතුරක් බැවින් සභාවේ නැවත වරක් එවැනි දේ සිදු නොවිය යුතු බව තමන් කුමන මට්ටමක සිටියද අනුන් එම මට්ටමට නොදමන ලෙස ද පවසන ලදී. එමෙන්ම තවදුරටත් අදහස් දක්වමින් ගරු සභාපතිතුමා පැවසූයේ ඇතැමුන් අවුරුදු 25 - 30 ක පමණ කාලයක් මන්ත්‍රීවරුන් වී සිටින අතර බුදුරජාණන් වහන්සේ පවසා ඇති පරිදි කෙනෙකු මිනිසෙකු හෝ බ්‍රාහ්මණයෙකු වන්නේ උපතින් නොව ක්‍රියාවෙන් බව පවසන ලදී.

ගරු සභාපතිතුමා අදහස් දක්වමින් නගර සභා ආඥා පනත හොඳින් කියවන ලෙසත් එහි 178 වගන්තිය සඳහා හිටපු ගරු අමාත්‍ය බැසිල් රාජපක්ෂ මැතිතුමා එක්කළ 2012

අංක 21 දරණ පළාත් පාලන ආයතන විශේෂ විධි විධාන පනත පරිදි සහභාගිත්ව අයවැයක් සකස් කර ඉදිරිපත් කළ හැකි බව පවසන ලදී. මෙම කරුණු ගැන අවබෝධයක් නොමැතිව සිදු වූ ප්‍රශ්නයේ දී මන්ත්‍රීවරුන්ගේ බුද්ධිය හා දැනුම පිළිබඳ ගැටලුවක් ඇති වූ අතර පළමුවර අයවැය සභාවට ඉදිරිපත් කළ අවස්ථාවේදී පළාත් පාලන කොමසාරිස් විසින් එම සභාව බල රහිත කළ අතර තමන් විසින් එය බල රහිත නොකළ බවද ඒ අනුව 2020-12-14 දින පැවති විශේෂ මහ සභාවේදී නැවත වරක් අයවැය ලේඛනය ඉදිරිපත් කළ අතර එය අයවැය පළමු වර ඉදිරිපත් කිරීමම වන බවද පවසන ලදී. එහිදී සංශෝධන රහිතව අයවැය සම්මත වූ බව පවසන ලදී. එබැවින් පනත හොඳින් අධ්‍යයනය කරන ලෙසද 2012 අංක 21 දරණ පළාත් පාලන ආයතන විශේෂ විධි විධාන පනත පරිදි අයවැය සම්මත වන බවද තමන් නැවත වරක් මෙම කරුණු පැහැදිලි කරන්නේ පුංචි හරි මොළයක් පවතීනම් තේරුම් ගැනීම සඳහා වන බවද නැවත වරක් අයවැය සභා ගත කළ යුතු වන්නේ මන්ත්‍රීවරුන් ඉදිරිපත් කරන සංශෝධන තමන් පිළිනොගන්නේ නම් පමණක් වන බව ද යැයි පැවසීය.

එමෙන්ම ගරු සභාපතිතුමන් අත්තනෝමතිකව අයවැයක් ඉදිරිපත් කරන්නේනම් එම අවස්ථාවේදී ගරු මන්ත්‍රීවරුන් විරුද්ධ වුවහොත් ගරු සභාපතිවරයා ඉල්ලා අස්විය යුතු බව පනතේ සඳහන්ව ඇති නමුත් එය කුමන ක්‍රමයටද යන්න සඳහන්ව නොමැති බවද තමුන් සභාවට ඉදිරිපත් කළ අයවැයේදී මන්ත්‍රීවරයෙක් සංශෝධනයක් ඉදිරිපත් කළ අවස්ථාවේදී තිබූ දේශපාලනික පක්ෂ භේදය නිසා එම සංශෝධනය පරාජය කළ නමුත් එයින් අයවැයට විරුද්ධ විය නොහැකි බවද සභාවේ ගරුත්වය හා බළන්ගොඩ ගරුත්වය රැකීමටනම් සභාවේ සියලු දෙනා පනත හොඳින් අධ්‍යයනය කර ඔලුවට දාගත යුතු බවද මන්ත්‍රීවරුන් දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කළ අවස්ථාවේදී ඇතැමුන් ඒ සඳහා සහභාගි නොවූ බවද මේවා දැනගෙන සභාවේ වැඩ කළ නොහැකි බව ඇතැම් අය පැවසූ බව ද සඳහන් කළේය.

එමෙන්ම එවැනි කාලයක් තිබූ නමුත් බුද්ධිමත් මිනිස්සු දැන් ඒවා පිළිනොගන්නා බවද අවුරුදු 15 ක 16ක කාලයක් සභාවේ වැඩ කටයුතු සිදු වූයේ කෙසේද කිය දන්නා බවද 2018 දී සභාවේ බලය වෙනත් කණ්ඩායමක් විසින් ලබා ගෙන සිදුවීමට තිබූ දෙය වැළැක්වීම සම්බන්ධව ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ මන්ත්‍රීවරුන්ට, රත්නපුර දිස්ත්‍රික් සංවිධායක භාණු මුණිප්‍රිය මැතිතුමාට, තලතා අතුකෝරල මැතිතුමියට- මෙන්ම සභාවේ මන්ත්‍රීවරුන්ට තමන් ස්තුතිවන්ත වන බවද එය බළන්ගොඩ ජනතාවගේ පිනට සිදු වූ දෙයක් බවද පවසන ලදී.

අප සභාවෙන් පිටතදී කොයි ලෙස දේශපාලනික වශයෙන් බෙදී සිටියද සභාව තුළදී එකම කණ්ඩායමක් බවද සභාපති ප්‍රමුඛ සභික මණ්ඩලයක් සභාවේ සිටින අතර තමන් නොමැති අවස්ථාවේදී සභාවේ සිටින සියලු දෙනාට සභාපති පුටුවේ වාඩිවිය හැකි බව ද ඒ සියලු දෙනාට සභාපති තනතුරේ අයිතිවාසිකම්, බලතල හා ගෞරවය තිබෙන බවද පැවසූ ගරු සභාපතිතුමා තමන් රුපියලක හෝ මුදලක් වංචා කර නොමැති බව ද දූෂණයක් නාස්තියක් නොකර සේවය කළ අතර ඒ සඳහා සියලු දෙනා අඩු වැඩි

වශයෙන් සහය දුන් බවද අද වන විට බලලෝභී කිහිපදෙනෙක් සභාවේ ප්‍රධාන පාලක තනතුර බලහත්කාරයෙන් ලබා ගැනීම සඳහා උත්සහ කරන බවද තමන්ට එය ගැටලුවක් නොවන බව ද පැවසීය. එමෙන්ම තමන්ට සභාවෙන් ඉවත්ව යාමට හැකියාවක් පවතින අතර සභාවෙන් රැගෙන යාමට කිසිත් නොමැති බවද එනිසා තමන්ට බිය වීමට අවශ්‍යතාවයක් නොමැති බවද තමන්ගේ ප්‍රිය බිරිඳ හෝ දරුවන් මෙම සභාවෙන් කිසි දිනක යැපී නොමැති බවද එදා හිටපු නායකයින්ගේ කුඩා දරුවන් උස් මහත් වී තිබේනම් ඒ තත්ත්වයට ඇවිත් තියෙන්නේ සභා දේපල මගින් බවද අදටත් ජීවත් වන්නේ සභා දේපල වලින් බවද පුලුවන් නම් එසේ නොවන බව ප්‍රකාශ කරන ලෙසද පවසන ලදී. තවදුරටත් අදහස් දක්වමින් ගරු සභාපතිතුමා පැවසූවේ සභාවේ මන්ත්‍රීවරුන්ට සභාවේ දේපල පවතින අතර ඇතැම් අවස්ථාවල පවුලේ වෙනත් අයවලුන්ගේ නම් වලින් සභා දේපල පවතින බවයි. එසේ ගත් දේපල කෝටි ප්‍රකෝටි ගණන් වලට විකුණා හම්බ කර ගෙන ඇති බවද මෙම පුටුවට නැවත ඒමට තැත් කරන්නේ එවැනි හොර ජඩ කණ්ඩායමේ කිහිප දෙනෙකු බව ද තමන්ට මෙයින් යාමේ කිසිදු ගැටලුවක් නොමැති බවද මෙම සභාව විනාශ කර නොයන බවද තමන් යන්නේ පිරිසිදු දෑතින් බවද තමන්ගේ හෘද සාක්ෂියට එකඟව වැඩ කරන බවද අනෙකුත් මන්ත්‍රීවරුන් ද තමන්ගේ හෘද සාක්ෂියට එකඟව කටයුතු කළ යුතු බවද පවසන ලදී.

එමෙන්ම ජනතාව අපිව පත් කර එවා ඇති අතර ඔවුන් සභාව පෝෂණය කිරීම මෙන්ම පිළිගැනීම ලබාදෙන බැවින් අපි ජනතාවට ගරු කළ යුතු වන බව පවසන ලදී.

අද දින සභාව සඳහා සහභාගි වූ ගරු උප සභාපතිතුමා ඇතුළු මන්ත්‍රී මණ්ඩලය සඳහාත් ලේකම්තුමිය ඇතුලු කාර්ය මණ්ඩලය සඳහාත් මාධ්‍යවේදීන් සඳහාත් ස්තුතිය පළ කරමින් මෙදින සභාවේ කටයුතු ප.ව.01.00 ට පමණ අවසන් විය.

චමික ජයමිණි විමලසේන,

සභාපති,

බළන්ගොඩ නගර සභාව.